# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 2171635 — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO — 1283 / 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 07/08/2024 පැය 0545

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - එරාවූර් පොලිස් වසම.

2024.08.06 වන දින රාත්‍රී කාලයේ එරාවූර් පොලිස් වසමේ මිච්චිනගර් ප්‍රදේශයේ නිවසක පුද්ගලයෙකු තියුණු ආයුධයකින් පහර දී ඝාතනය කර ඇති බවට ලද පණිවිඩයක් මත එරාවූර් පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ මිච්චිනගර්, එරාවූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණ සඳහා සිද්ධිය වූ ස්ථානයේ පොලිස් ආරක්ෂාව යටතේ තිබෙන අතර ඝාතනය සිදුකළ සැකකරුවන් මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැත. සැකකරුවන් අත්අංඩංගුවට ගැනීම සඳහා එරාවූර් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. මනුෂ්‍ය ඝාතනයක් - හංවැල්ල පොලිස් වසම.

2024.08.06 වන දින දහවල් කාලයේ හංවැල්ල පොලිස් වසමේ තුම්මෝදර කුමාරි ඇල්ලට යන මාර්ගයේ පුද්ගලයෙකු තියුණු ආයුධයකින් පහර දී ඝාතනය කර ඇති බවට ලද පණිවිඩයක් මත හංවැල්ල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ නැව්ගල, වරකාපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කර අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඝාතනය සිදුකළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා හංවැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවකු අත්අඩංගුවට - බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.07.08 වන දින අතුරුගිරිය පොලිස් වසමේදී පුද්ගලයන් දෙදෙනෙකු ඝාතනය කර තවත් සිව් දෙනෙකුට බරපතල තුවාල සිදුකිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් විමර්ශනය සිදුකර මෙම ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2024.08.06 වන දින දක්ෂිණ අධිවේගී මාර්ගයේ සේවා පියසේදී අත්අඩංගුවට ගෙන අතුරුගිරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන දර්ගා නගරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු අපරාධයට පෙර සැකකරුවන්ට කුලී නිවසක් ලබා ගැනීම හා අම්බලන්ගොඩ ප්‍රදේශයේ සිට වෙඩික්කරුවන් දෙදෙනා හා ආයුධ අතුරුගිරිය ප්‍රදේශයට රැගෙන යාමට කුලී වෑන් රථයක් සම්බන්ධ කර දී ඇති බවට අනාවරණය වී ඇත.

මෙම අපරාධයට සම්බන්ධව අත්අඩංගුවට ගත් සැකකරුවන්ගෙන් අනාවරණය වූ තොරතුරු මත වෙඩික්කරුවන්ට දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ පලා යාමට භාවිතා කළ බස් රථය කතරගම ප්‍රදේශයේ පුද්ගලයෙකුට විකුණා තිබියදී බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් 2024.08.06 වන දින පොලිස් භාරයට ගෙන අතුරුගිරිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. මෙම සිද්ධිය සම්බන්ධයෙන් මේ දක්වා සැකකරුවන් 11 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.08.06 වන දින සවස් කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රිය ස්ථානය අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. හෙරොයින් සමග සැකකරුවකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.08.06 වන දින රාත්‍රී කාලයේදී ගල්කිස්ස පොලිස් වසමේ සොයිසාපුර ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. දියේ ගිලී අතුරුදහන්වීමක් - ගල්කිස්ස පොලිස් වසම.

2024.08.06 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ ගල්කිස්ස දුම්රිය ස්ථානය අසල මුහුදු තීරයේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දිය වැලකට හසුව ගසාගෙන ගොස් ඇති බවට ලද පැමිණිල්ලක් මත ගල්කිස්ස පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ පුද්ගලයා වයස අවුරුදු 63 ක් වන රජමාවත පාර, රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නාවික හමුදාව, පොලිසිය එක්ව අතුරුදහන් වූ පුද්ගලයා සෙවීමේ කටයුතු වල නිරතව සිටී. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 07. දියේ ගිලී මියයාමක් - දෙමටගොඩ පොලිස් වසම.

2024.08.05 වන දින උදෑසන කාලයේ දෙමටගොඩ පොලිස් වසමේ දෙමටගොඩ දුම්රිය ධාවනාගාරයේ සේවයේ නියුතු සේවකයෙකු අතුරුදහන්ව ඇති බවත් ඔහුගේ ජංගම දුරකථන, පාවහන් යුගල සහ විදුලි පන්දම පැරණි ළිඳ අසල තිබී හමු වූ බවට කරන ලද පැමිණිල්ලක් මත දෙමටගොඩ පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

ඒ අනුව 2024.08.06 වන දින නාවික හමුදා කිමිදුම්කරුවන් සහ පොලිස් ජීවිතාරක්ෂක නිලධාරීන් එම ළිඳ පරීක්ෂා කළ අතර හමු නොවූ බැවින් ළිඳෙහි ජලය ඉවත් කරන ලද අතර පසුව සවස් කාලයේදී අතුරුදහන් පුද්ගලයාගේ මෘත ශරීරය හමු වී ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වන වටවලකන්ද, වැලිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකර කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. දෙමටගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. මාරක රිය අනතුරක් - මොරටුව පොලිස් වසම.**

2024.08.06 වන දින උදෑසන කාලයේ මොරටුව පොලිස් වසමේ කොළඹ ගාල්ල මාර්ගයේ ඕ.එල්.වී. විදුහල් හන්දියේදී පානදුර දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ ලොරි රථයක් එම දිසාවටම ධාවනය වූ යතුරුපැදියක බඳෙහි ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පසු පැදිකාරිය සහ කුඩා දැරියක් බරපතල තුවාල ලබා පානදුර රෝහලට ඇතුලත් කිරීමේදී පසු පැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 32 ක් වූ හොරෙයිතුඩුව, කෙසෙල්වත්ත ප්‍රදේශයේ පදිංචි ගැබිණි කාන්තාවකි.**

මෘත ශරීරය පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**